





# ලෝක ප්‍රතීතන දිනය 2018








01 වැනි පිටුවෙන්...

විවිධ වැඩ පරිසර තුළ සිදු වූ වෘත්තීමය හදිසි අනතුරු සහ වෘත්තීය සම්බන්ධ රෝගාබාධ වැනි අප්‍රසන්න අත්දැකීම් නිසා මේ සම්මන්ත්‍රණය තුළ දී සුරක්ෂිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන ලදී. තවදුරටත් එය පිරිවැය අවම කිරීමේ, සේවකයන්ගේ නොපැමිණීමේ සහ සේවය හැරයාම් අනුපාතය අවම කිරීම්, අඩු අනතුරු නීතිමය ක්‍රියාමාර්ගවල තර්ජනය අවම කිරීම, ව්‍යාපාරවල සෞඛ්‍යමත් සහ දිරිමත් සේවක ප්‍රජාවක් හරහා ක්‍රියාමාර්ග වල තර්ජනය අවම කිරීම ආයෝජකයන් සහ ගනුදෙනුකරුවන් අතර ආයතනික වගකීම් ආරක්ෂා කිරීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම් ක්‍රමවේදයක් ලෙස හඳුනාගෙන ඇත.

රජයේ සහ නියාමන මණ්ඩලවල කාර්යභාරය වන්නේ ව්‍යාපාරයන් මඟින් සුරක්ෂිත වැඩ පරිසරයක් නිර්මාණය කරන බවට තහවුරු කිරීමයි. ඒවා මඟින් වෙළෙඳපොළ තුළ ඇති භාණ්ඩ හා සේවාවන්හි ප්‍රතිපත්ති හා තාක්ෂණික අවශ්‍යතා සකස් කළ හැකිය. එම අවශ්‍යතා සමඟ අනුකූලවීම තහවුරු කර ගැනීම සඳහා ප්‍රතීතනය කරන ලද අනුකූලතා ඇගයුම් ආයතන මත රැඳී සිටීමට සිදු වේ.

මේ සම්මන්ත්‍රණයට ප්‍රතිපත්ති සම්පාදකයන් නියෝජනය කරමින් පාර්ශ්වකරුවන් රාජ්‍ය ආයතන නියාමන මණ්ඩල අනුකූලතා ඇගයුම් ආයතන, ශාස්ත්‍රාලිකයන් සහ පර්යේෂණ සංවිධාන පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් උනන්දුව දක්වන කණ්ඩායම් පාරිභෝගිකයන් සහ මාධ්‍ය නියෝජිතයෝ විශාල පිරිසක් සහභාගි වූහ.

ඡායාරූප - ගයාන් පුෂ්පික





# 45 වැනි පාසල් විද්‍යා වැඩසටහන




විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මහනුවර ජාතික මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යා අධ්‍යාපන සහ ව්‍යාප්ති ඒකකය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන පාසල් විද්‍යා වැඩසටහනේ 45 වැනි වැඩසටහන අගෝස්තු මස 7 සිට 10 වැනිදා දක්වා ජාතික මූලික අධ්‍යයන ආයතන පරිශ්‍රයේ දී පැවැත්වේ. විද්‍යාව හදාරන පාසල් සිසුන් විද්‍යා පර්යේෂණ කෙරෙහි උනන්දු කරවීම මෙහි අරමුණ වේ.

දින 4ක් පුරා පැවැත්වෙන මේ වැඩසටහන තුළ දේශන, වැඩමුළු සහ විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් වේ. සිසුන් 150කට පමණක් සහභාගි විය හැකි මේ වැඩමුළුවට 2017 අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් එකවර විශිෂ්ට සාමාර්ථ 9ක් ලබාගත් සහ අ.පො.ස (උ.පෙළ) විද්‍යා විෂයන් හදාරන සිසු සිසුවියන් හට අයදුම් කළ හැකිය.

අයැදුම්පත් පාසලේ විදුහල්පති තුමාගෙන්, ජාතික මූලික අධ්‍යයන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් ( www.nifs.ac.lk) හෝ ලිපිනය ලියූ මුද්දර කවරයක් අංශ ප්‍රධාන, විද්‍යා අධ්‍යාපන සහ ව්‍යාප්ති ඒකකය, ජාතික මූලික අධ්‍යයන ආයතනය, හන්තාන පාර, මහනුවර යන ලිපිනයට ජූනි 28 ට පෙර ඒවා ලබාගත හැකිය. සම්පූර්ණ කරන ලද අයැදුම්පත් ජූලි 5 හෝ ඊට පෙර ඉහත ලිපිනයට එවිය යුතුය.

**ප්‍රදීප් පියතිලක**
ජාතික මූලික අධ්‍යයන ආයතනය - මහනුවර





විද්‍යා වැඩසටහනට සමගාමීව පාසල් සිසුන් අතර විද්‍යා විෂය ප්‍රචලිත කිරීමේ අරමුණින් සිසුන් 500ක් සඳහා කොළඹ දේවි බාලිකා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ පැවැති වැඩමුළුවේ දී වයඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සී.ඒ.එන් ප්‍රනාන්දු මහතා සිය විශේෂ දේශනය පැවැත් වූ අයුරු හා ඊට සහභාගී වූ ගුරුවරුන් හා සිසු සිසුවියන් ඇතුළු පිරිස මෙහි දැක්වේ.

ඡායාරූප - රුවන් ද සිල්වා

වෂ් 2018 ක් වූ ජූනි මස 27 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.